# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

36 වන කාණ්ඩය | 01 වන කලාපය | සංවත්සර කලාපය




# 35 වසරක් පුරා වැඩකරන ජනතාව වෙනුවෙන්

## ඇතුළු පිටු


03 පිටුව - ඔබ... ආ මඟ හා සාහිත්‍ය ලිපිය

04 - 05 පිටු - නොනිමි මෙහෙවර

06 පිටුව - සුබ පැතුම්

07 පිටුව - සිතුවිල්ල

## ඩාබිඳු සාමුහිකය

වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : Dabindu Collectire Sri Lanka


# බාධක බිඳ හැර තිස්පස් වසරක්

1984 සැප්තැම්බර් මස උපත ලද ඩාබිඳු සාමුහිකය 2019 සැප්තැම්බර් මස සිය 35 වන සංවත්සරය සමරනු ලබයි.

වසර 40 ඉතිහාසයකට උරුමකම් කියන ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරුවන් මෙරටට විදේශ විනිමය ඉපැයීම සඳහා කරන කැප කිරීම ඔවුන්ගේ වෘත්තීය අයිතීන් අහිමි කරමින් අභියෝගයට ලක් කර ඇත.

ප්‍රාග්ධනය, ලාභය ශ්‍රම ප්‍රමිති ප්‍රතිලාභ හා කොන්දේසි වල රැකවරණය අහිමි කරවීමට ගත්තා වූ සෑම උත්සාහයකදීම කම්කරුවා පරාජයට පත්විය. වෘත්තීය අයිතීන්, වෘත්තිය සමිති ළගාකර ගත නොහැකි අයිතීන් ලෙස ගිලිහෙද්දී වර්තමාන කම්කරුවා අස්ථිර සේවකයින්ගේ ගොඩට තල්ලු වෙමින් මිනිස් බල ආයතන වල හස්තයට හසුව ඇත.

පැය 8 සේවා කාලය වෙනුවට පැය 9 ක් වැඩ සතිය හිටගෙන වැඩ කිරීම, වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව නොලබා මුලික කම්කරු අයිතීන් වල රැකවරණය අහිමි කරන්නා වු නව ප්‍රවණතාවන් වලට මුහුණ දීමට කම්කරුවාට සිදු වී ඇත.

පසුගිය වසර 71 ක් කාලයක් තුළ මේ රට පාලනය කරපු ආණ්ඩු විසින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ පිළිබඳ අවධානය යොමුකරමින් ප්‍රතිපත්ති ඉදිරිපත් කළත් අද වන තුරුත් කම්කරු ප්‍රඥප්තියක් ගෙන ඒමට මේ කිසිවකුත් සමත් වී නැත. එසේම පසුගිය කාලයේ රටේ සිදු වු අභාග්‍ය සම්පන්න තත්වයන් හමුවේ වගකිව යුතු පිරිස් හැසිරෙන අකාරය පිළිබඳ ඇති වුයේ බලවත් කණගාටුවකි. ජනධිපතිවරයාට හා පාර්මේන්තුවට රට පාලනය කිරීමට ඇති නොහැකියාව විදහා පාමින් අවසානයේ නතර වුයේ රට තුළ අන්තවාදය, ආගම්වාදය පතුරවමින්ය.

යුද්ධය අවසන් වී වසර 10 ක් අවසන්ව ඇතත් ඔවුනගේ ගැටලු වලට අවධානය යොමු කර ප්‍රතිපත්ති සම්පාදනයේ වී ක්‍රියාත්මත වන තැනට කටයුතු සිදු වී නොමැත. සංක්‍රමණික කාන්තාවන් තේ වත්තේ කාන්තාවන් උපයන ලාභයේ කොටස් කරුවන් වීම අහිමි කරන්නේ ඉල්ලන හැම ඉල්ලීමක්ම ප්‍රතික්ෂේප කරමිනි. මෙම හැම ඉල්ලීමක්ම උද්ඝෝෂණයකින් අවසන් වුයේ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටිය යුත්තන් පාලකයන්ගේ අතකොලු බවට පත්වෙමිනි.

ඉදිරියේ පැවැත්වීමට නියමිත මැතිවරණ හමුවේ තවත් අවුරුදු 5 කට රට උගසට නොතබා නව චින්තනයකින් යුත් සාමුහිකත්වය පෙරදැරි කරගත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ කෙරෙහි අවධානය යොමු කරන රජයක් බලයට පත් කිරීමට පෙරමුණ ගනිමු.

# ඩාබිඳු හෙළන ගැහැනුන්ගේ අරගලයට සවියක් වූ ඔබට...

විවෘත ආර්ථිකයත් සමඟ 1978 වසරේ මෙරට විවෘත වන නිදහස් වෙළෙඳ කලාප එක් අතෙකින් ඒ වන විට රටේ බිඳ වැටුණු ආර්ථිකයටද දහස් ගණනක් වූ රැකියා වියුක්තිකයන්ටද මනා පිටුවහලක් විය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති සමඟ මෙරට කෘෂිකර්මාන්තයේ බිඳ වැටීමක් සිදුවීම නොවැළැක්විය හැකිව තිබුණි. විශේෂයෙන්ම ග්‍රාමීය තරුණ තරුණියන් ගොවිතැනට වඩා ඇඟලුම් කර්මාන්තය වෙත ආකර්ෂණය කර ගැනීමට ඒ වන විට ලංකාවේ ගොඩනැගී තිබූ අපනයන සැකසුම් කලාප සමත් විය. මෙම කලාප තුළ තරුණියන්ට රැකියා අවස්ථා සුලබ වූ අතර අඩු වයස් ඇති තරුණියන්ට වුවද කලාපයේ රැකියා ලබා ගැනීමට හැකිවන තරමේ ප්‍රවණතා උද්ගත විය.

එහෙත් නිදහස් වෙළෙඳ කලාප මෙරට ඇරඹෙන්නේම වෘත්තීය සමිති තහනම් කරමින් වීම උත්ප්‍රාසජනකය. අතිවිශාල කම්කරුවන් පිරිසක් සේවයේ නියුතු නිදහස් වෙළෙඳ කලාප තුළ, වෘත්තීය සමිති තහනම් කිරීමට එරෙහිව සේවකයන් ගෙන ගිය විශාල අරගලයක ප්‍රතිඵලයක් ලෙස මේ වන විට වෘත්තීය සමිති ගොඩනැගීමටත් ඔවුන්ට යම් බලයක් මෙම කලාපයන්හි පවත්වා ගැනීමටත් අවස්ථාව ලැබී තිබේ. විශේෂයෙන්ම ගමෙන් නගරයට සංක්‍රමණය වූ කම්කරුවන්ගෙන් නිදහස් වෙළෙඳ කලාප ගහන නිසාම මොවුන්ට සැඟවුණ වියදම් බොහෝය. නේවාසිකව ජීවත් වීමට සිදුවීම නිසාම දෛනික වියදම්, අතහැර දමන ලද වේතන හෝ ප්‍රතිලාභ, මානව සංවර්ධන පිරිවැය, වැඩපොළේ දී හා ප්‍රජාව අතර දී නිරන්තරයෙන් ලිංගික අතවරවලට හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමත් එම කාන්තාවන්ගේ ස්වයං ගරුත්වයට වන බලපෑමත් මෙම සැඟවුණු වියදම්වලටම අයත් වේ.

නිදහස් වෙළෙඳ කලාප තුළ සේවයේ නියුතු සියලු කම්කරුවන් වෘත්තීමය ගැටලු රැසකට මුහුණ පාන බව සැබෑවක් වුවද එම පිරිස අතරින් කාන්තා ශ්‍රමිකයන් මුහුණ පාන ගැටලු සුවිශේෂි මෙන්ම අතිශය කටුක බව අප දන්නා සත්‍යයයි. වැටුප් විෂමතාවන්, ලිංගික හිංසන, ලිංගික අඩත්තේට්ටම්, සමාජීය අපවාදයන්, මානසික අසමතුලිතභාවය, දරුවන්ගේ ගැටලු, සෞඛ්‍ය ගැටලු, නුසුදුසු ස්ථානවල වැඩ පැවරීම් යනාදී දහසකුත් එකක් අර්බුදයන්ට මුහුණ දෙන කාන්තා ශ්‍රමිකයන්ගේ මෙම ගැටලු සම්බන්ධයෙන් පෙනී සිටිනුයේ බොහෝ විට පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය සමිතිවලටද වඩා වසර තිස්පහක් කලාපයේ ගැහැනුන්ගේ ගැටලු වෙනුවෙන් අරගල කළ ඩා බිඳු සාමූහිකය වැනි සිවිල් සමාජ සංවිධානය.

උතුරු නැගෙනහිර දෙමළ තරුණ තරුණියන්ද විශාල වශයෙන් මෙම නිදහස් වෙළෙඳ කලාපවල සේවකයින් වශයෙන් සේවයට එක්වී තිබෙන අතර ඔවුන් තවදුරටත් භාෂාව, ආගම, ජාතිය මත වෙනස්කොට සැලකීමට ලක්වීම නිදහස් කලාපය තුළ උරුමයක්ව පවතී. 1978 දකුණේ නිදහස් කලාප බිහිවීම සිදුවූවද තිස් අවුරුදු යුද්ධය අවසන් කිරීමත් සමඟ උතුරු නැගෙනහිර නිදහස් වෙළෙඳ කලාප වැඩි වැඩියෙන් විවෘත වීම ඇරඹුණ අතර දෙමළ තරුණ තරුණියන් විශාල වශයෙන් මේ වෙත ආකර්ෂණය වුහ. දකුණේත් උතුරේත් වෙළෙඳ කලාප තුළ සේවය කරන තරුණියන් ආර්ථික, සමාජ හා සංස්කෘතික වශයෙන් සමාන ගැටලුවලට මුහුණ දෙන බව ඔවුන් සමඟ වසරක පමණ කාලයක් එක්ව වැඩ කළ අප අත්දැකීමය. ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප ආරම්භ කර වසර හතළික් පමණ ඉක්ම වුවද මෙම සේවකයින් ජීවත් වන ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් ආයෝජන මණ්ඩලය, රජය හෝ පරිපාලන අංශයෙන්ගේ කිසිදු උනන්දුවක් නැත. මැන් පවර් ක්‍රමවේදය හේතුවෙන් සේවිකාවන් විශාල හිංසනයන්ට ශ්‍රම සූරා කෑමට භාජනය වුවද දවසේ වැටුප වෙනුවෙන් බොහෝ කාන්තාවන් ඒ වෙත යොමුවීමේ අවධානමද උද්ගතව තිබේ. මෙම තත්ත්වයන් නියාමනයට රජය හෝ බලධාරීන් කිසිදු පියවරක් ගන්නා බවක්ද පෙනෙන්නට නැත.

නිදහස් වෙළෙඳ කලාප තුළ කම්කරු ප්‍රජාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් හඬ නගන්නේ වෘත්තීය සමිතිය. එහෙත් මෙම වෘත්තීය සමිතිවල සැකැස්ම බොහෝ විට පුරුෂවාදීය. ඒවා පොදුවේ කලාපීය කම්කරුවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් පෙනී සිටියද ඇඟලුම් සේවිකාවන් විෂයෙහිලා අත්දකින දුෂ්කරතාවයන් ආමන්ත්‍රණය කිරීමම අරමුණු කර නොගනී. එහෙත් පොදුවේ කලාපීය කම්කරු ප්‍රජාව මෙන්ම විශේෂයෙන්ම කලාපයේ ගැහැනුන් මුහුණ දෙන අසීරුතා වෙනුවෙන් වසර තිස්පහක් කලාපය ආශ්‍රිතව හිඳිමින් අරගල කළ සිවිල් සමාජ සංවිධානයක් වන ඩාබිඳු සාමූහිකයේ කර්තව්‍ය සුවිශේෂි වන්නේ එනිසාමය. රටේ විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධානතම තෝතැන්න වන නිදහස් වෙළෙඳ කලාපවල වැඩ කරන කම්කරුවන් වෙත එහි ප්‍රතිලාභ ගලා නොයාම, කම්කරුවන්ට හිතකර නොවන නීති පැවතීම, කම්කරුවන්ගේ වැඩ පරිසරය යහපත් නොවීම, පවුල් සෞඛ්‍ය ගැටලු, සියදිවි නසා ගැනීම්, ලිංගික හිරිහැර යනාදී තත්ත්වයන්හි යම් හෝ යහපත් වෙනසක් ඇති කර ගැනීම වෙනුවෙන් ඩාබිඳු සාමූහිකය දශක තුනකට අධික කාලයක් පුරා ප්‍රයත්න දරා තිබෙන අතර මේ වන විට උතුරේ නිදහස් වෙළෙඳ කලාප තුළ කාන්තාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධවද විශේෂ අවධානයකින් ඔවුන් කටයුතු කරති.

ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප පවතින තාක් කම්කරුවන්ද සිය අයිතිවාසිකම් ඉල්ලීම් බොහෝ විට සිදුවනු ඇත. අපි රටක් වශයෙන් කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා දක්වා ඇති ප්‍රගතිය මේ දක්වා එබඳුය. එනිසාම කම්කරු සේවක සේවිකාවන්ට සිය වෘත්තීය අයිතිවාසිකම් ඉල්ලා සිටීම වෙනුවෙන් සාමූහිකව කේවල් කිරීමට නිදහස් වෙළෙඳ කලාපීය සේවක සේවිකාවන්ගේ ගැටලු ඔවුන් තරමටම හොඳින් දන්නා ඩාබිඳු සාමූහිකය සෑම අතින්ම ශක්තියක් වනු නිසැකය.

**තිස්පස් වසක ඩාබිඳු අරගලයට සමබිම සුබ පැතුම්...**



# ඔබ... ආ මඟ

1984 බිනර මාසයේ දී කුඩා ස්ත්‍රී කණ්ඩායමක එකමුතුවේ හා ශක්තියේ අනගි ප්‍රතිඵලයක් ලෙස ඩාබිඳු සාමූහිකය නම් කම්කරු සේවා ස්ථානය බිහිවිය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් 1978 දී කටුනායක නිදහස් වෙළඳකලාපය බිහිවීමත් සමඟ සේවක සේවිකාවන් පොදුවේ මුහුණ දුන් කම්කරු ප්‍රශ්ණ මෙන්ම විශේෂයෙන් ස්ත්‍රීන් වීම නිසා සේවිකාවන් විඳිනා ත්‍රිත්ව පීඩනය (වැඩපළේ, බෝඩිම, මඟතොටදී) පිළිබඳ ලිපි වාර්ථා හා නිර්මාණ වශයෙන් ගොනු කොට හා පුරා කියා.. ඩාබිඳු පුවත් පත එළි දැක්වූහ..

සැබවින්ම ඩාබිඳු බිහිවන විට කලාපය තුළ කිසිදු කම්කරු ප්‍රශ්ණ පිළිබඳ ප්‍රකාශනයක් එළි දක්වා තිබුනේ නැත. කලාපය තුළ ප්‍රකාශන බේදිමේ නිදහසක් ද තිබුනේ නැත. මහ පාරේ සිට ඩාබිඳු බෙදා හැරිය හැටි අපට තවමත් සිහි වේ. බෝඩිම තුළට පැමිණ අපගේ කම්කරු සෞඛ්‍ය ප්‍රශ්න ගැන විසඳුම් ලබාදීමට වැඩි ප්‍රයත්නයක් දැරුව. නමුත් අද දක්වා ඩාබිඳු සොයුරියන් නොසැලී මේ දක්වා ඉදිරියට පැමිණීම ගැන අපට ඇතිවන්නේ ඉමහත් සතුටකි.

1987 දී ස්ටාර් ගාර්මන්ට් ආයතනයේ සේවය කළ කේ.පී ජයසුන්දර මැණිකේ නමැති සේවිකාව ජීවිතය නම් කවි පංතිය ලියූ නිසා වැඩ තහනමකට ලක් විය. මෙහිදී ඩාබිඳු නායකත්වය තුළින් හා විදෙස් සංවිධාන වලින්ද සහය ඇතිව නැවත ඇයට රැකියාව ලබා දුන්නා. එය ඩාබිඳු ලැබූ ජයග්‍රහණයකි.

සංවිධානය වීමේ අයිතිය හා ස්වකීය ගැටලු වලට විසඳුමක් නොමැති සේවිකාවන්ට විවේකයක් ලද විට ඒ දුක අකුරු වැලක ඇමිණීමට අමතක නොකලාය. ඔවුන්ගේ පුංචි වෑයමේ ප්‍රතිඵලක් ලෙස 1984 දී ''විනිශ්චය කරනු මැන'' පොත් පිංචය එළිදැක්වීමට ඔවුන්ට හැකි විය. එයින් ඔවුන්ගේ කුසලතා දිරිගැන්වීමක් විය.

1997 වසරේදී ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප පිළිබඳ විමසුමක් යන මැයෙන් පොතක් මුද්‍රණය විය. එය කම්කරු සොයුරියන් මුහුණ දෙන දුක්ඛිත වූ සත්‍ය වූ අත්දැකීම් වලින් පිරුණු ලද්දකි.

ඊලඟට ඔබලාගේ කාර්යය වූයේ, කම්හලේ මැෂිමට ගත රුහිරු වැය කරද්දී, ආදරය සෙනෙහස මුවාවෙන් රැවටීම් වලට ලක් වූ ස්ත්‍රීන් වෙත උපදේශන සේවාවන් සිදු කිරීමය.

දෙමාපියන්ට බරක් නොදී පවුල නඩත්තු කිරීමටත් තම ආර්ථිකය ගොඩනගා ගැනීමටත් නාගරික පරිසරයකට පැමිණෙන ඔවුන්ට විවිධ දුෂ්කරතා වලටත් බේදනීය අත්දැකීම් වලටත් මුහුණ දීමට සිදු වේ. මෙසේ තාරුණ්‍ය කලාපයට දියවෙද්දී ආදරය සෙනෙහස මුවාවෙන් වංචාකාරී අවස්ථාවාදී පුද්ගලයන්ට මුලා වී වන්දි ගෙවීමට සිදු වි ඇත. මේ පිළිබඳ පොස්ටර් මඟින්ද ඩාබිඳු අපව දැනුවත් කර ඇත.

පසුකළ ගමන් මගෙහි වූ මිහිරි, අමිහිරි මතකයන්ද ගෙන දෙන්නේ ඉතාමත් වටිනා අත්දැකීම්ය. ඒම අත්දැකීම් පදනම් කොට ගෙන නිර්භයව ක්‍රියාත්මක වීමට ගොඩනගා ගත් ශක්තිය, වසර 35 ගෙවූ ඩාබිඳු සාමූහිකයට ඉදිරිකලයටත් ලැබේවායි සුභාශිංසනය කරමි...

වසන්ති ඔබේසේකර - U.T.P

# පොත් කියවන්න ඇබ්බැහි වෙමු

කාලයි වේගයෙන් ගෙවිලා ගිහින් සැප්තැම්බර් මාසෙටත් ආවා. සැප්තැම්බර් කියනකොට අපි හැමෝටම මතක් වෙන්නේ සාහිත්‍ය මාසයනෙ. දැන් ඉතිං පොත් ප්‍රදර්ශනයට ගිහින් පොත් ටිකක් ගන්නත් කීයක් හරි ඉතුරු කර ගන්න ඕනා. ඉතිං පොත් කියවීමේ වැදගත්කම අපි හැමෝම දන්න නිසා අද මට හිතුණා ටිකක් වෙනස් දෙයක් ඔයාලා එක්ක බෙදා ගන්න. ඒ තමයි මම කියවලා තියෙන රසවත් පොත් කිහිපයක තොරතුරු. ඉතිං ඔයාලා මේ පොත් කියවලා නැත්නම් මේ සාහිත්‍ය මාසෙදි ඒ පොත් අරගෙන, එහෙමත් නැත්නම් පුස්තකාලෙකින් හරි යාළුවෙකුගෙන් හරි ඉල්ලගෙන කියවලා බලන්න.

පොලියානා
කතෘ : එලීනර් එච්. පෝටර්
පරිවර්තනය : කත්‍යානා අමරසිංහ

පොලියානා කියන්නේ අවුරුදු 11ක පොඩි ගැහැණු ළමයෙක් වටා ගෙතුණ කතාවක්. හැබැයි ඔයාලා හිතනවා වගේ මේක ළමා කතාවක්ම නෙමෙයි. ලොකු කුඩා ඕනම කෙනෙකුට මේ පොතෙන් ගන්න ගොඩක් දේවල් තියෙනවා. පොලියානාගෙ විශේෂත්වය තමයි එයා හැමදෙයකම සතුටු වෙන දෙයක් ගැන හොයන්න උත්සාහ කරන එක. ඔන්න ඉතිං පොලියානාගෙ වචන වලින්ම ඒ ගැන දැනගන්නකෝ. "ඒක සෙල්ලමක්... ඒකට කියන්නෙ 'නිකම්ම සන්තෝස වෙන්න' සෙල්ලම කියලා... ඒ සෙල්ලම තමා හැමදේකම තියෙන සතුටු වෙන්න පුළුවන් දෙයක් හොයන එක... හේතුවක් හොයාගන්න අමාරු වෙන තරමට ඒකෙ විනෝදෙත් වැඩී.." ජීවිතයේ අපිට නැති දේවල් ගැන අපි කොයි තරම් දුක්වෙනවද? ඒත් මේ පුංචි ගෑණු ළමයා ඒ අභියෝගය ජයගන්නවා. එයා සතුටින් ඉන්නවා විතරක් නෙමෙයි, අනිත් අයටත් සතුට බෙදනවා. ඉතිං ඔයාලාත් සතුටින් ඉන්න කැමති නම් මේ පොත කියවලා බලන්නකෝ.

ගුරු ගීතය
කතෘ : චිංගීස් අයිත්මාතව්
පරිවර්තනය : දැදිගම වී. රුද්‍රිගු

මේ පොත පරිවර්තනයක් වුණත් ලංකාවේ පාඨකයන් අතරත් බෙහෙවින් කතාබහට ලක්වුණු පොතක් කියලා කියන්න පුළුවන්. එකවර ගුරුවරයෙකුත් නිහඬ පෙම්වතෙකුත් බවට පත්වෙන දුයිෂෙන් ආදරය කියන්නෙ තමන්ට හිමිකර ගැනීමම නොවන බව මේ කතාව තුළින් හරි අපූරුවට පෙන්වා දෙනවා. ඒ ආදරය සහ මඟපෙන්වීම තමයි අල්තිනායිගේ ජීවිතය සාරවත් කරන්නෙ.

'ශීත කාලය පැමිණේවි,
තද ශීත කුණාටු හමාවි,
හිම කැට සහිත මහ
නපුරු සුළි සුළං හමාවි..
එහෙත් වසන්තය එනවා සත්තයි..'

රුසියානු සමූහාණ්ඩු පාලනය යටතේ වුණත් සංස්කෘතික බැමි වලින් මිදෙන්න ගැහැණු ළමයෙකුට ඇති අපහසුතාවය, අධ්‍යාපනයේ අයිතිය දිනාගන්න ගෙනියන අරගලය මේ කතාවෙන් මනාව ඉස්මතු කරනවා. ඉතිං වැඩි තොරතුරු දැනගන්න ඕනෙ නම් මේ කතාව කියවලාම බලන්නකෝ.

යුගාන්තය
කතෘ : මාටින් වික්‍රමසිංහ

මාටින් වික්‍රමසිංහ ශූරීන් ගත්තම එතුමාගෙ විශිෂ්ට නවකතා බොහොමයක් තියෙනවා. ඒත් මම යුගාන්තය ගැන ලියන්න හිතුවෙ ඒක කම්කරු පංතියට විශේෂ නිසා. ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය මේ තමයි තුන් ඈඳුතු නවකතාව. යුගාන්තයේ දැක්වෙන්නේ තමන්ගේ පෞද්ගලික සුඛ විහරණය තකා කම්කරුවන්ගේ ශ්‍රමය සූරා කන පාලක පන්තියට එරෙහිව කම්කරු පන්තියේ නැගී සිටීමයි. මේ කම්කරු සටනට සහාය ලබා දෙන්නෙත් ඒ පාලක පන්තියෙන්ම බිහිවුණු, නමුත් මේ ක්‍රමයේ දුර්වලතාවයන් වටහාගත් මාලින් විසින්. යුගාන්තය අවසන් වෙන්නේ කම්කරු පංතියට නව බලාපොරොත්තුවක් එකතු කරමින්. ඉතිං මේ පොත කියවලා නැත්නම් ගම්පෙරළිය, කලියුගය, කියවලාම යුගාන්තය කියවලා බලන්න. එතකොට මේ පොත වඩාත් රසවත් වෙයි.

ඉතිං අද ඉදිරිපත් කළේ මම කියවලා තියෙන ලස්සන පොත් තුනක් ගැන තොරතුරු. මේවා මගේ ප්‍රියතම පොත් තුන නොවුණත් මම කැමති පොත් ගොන්නෙ තියෙන පොත් කිහිපයක්. ඔයාලා මේවා කියවලා නැත්නම් දැන්වත් කියවන්න උත්සාහයක් ගන්න. ඒ වගේම ඔයාලා කියවපු රසවත් පොත් ගැන තොරතුරු අනිත් අයත් එක්ක බෙදා ගන්න කැමති නම් අපිට ලියලා එවන්න.

ජයනි ප්‍රනාන්දු

# නොනිම් මෙහෙවර...

ඩාබිඳු සාමුහිකය අරඹා වසර 35 ක් ගෙවී ඇත. ගෙවු කාලය දෙස ආපසු හැරී බලන විට අප පැමිණි මගෙහි සන්ධිස්ථාන, නැගිටීම් මෙන්ම වැටීම් ද ආවර්ජනය කරන්නත්, අතීතයේ ලද අභියෝග හා ගර්ජන මෙන්ම, ජයග්‍රහණයන් පරාජයන් ආවර්ජනය කොට ඉදිරි මඟ සැලසුම් කිරීමත් අපගේ වගකීමකි.

ඩාබිඳු සාමුහිකය බිහිවුනේ වෙළඳ කලාප කම්කරුවන්ට පාලකයින් ගෙන් සිදුවන අක්‍රමිකතා දුරලා ඔවුන්ගේ සුභ සිද්ධිය හා කම්කරු අයිතීන් උදෙසා කටයුතු කිරීමේ අරමුණු පෙරදැරි කරගෙනය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය යහපත් කිරීමේ අරමුණින් හා විරැකියාවට විකල්පයක් වශයෙන් එවකට පැවති රජය විසින් 1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ලැබිණි. ඒ යටතේ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන සංවර්ධන වැඩ පිළිවෙලක් ලෙස නිදහස් වෙළඳ කලාප ආරම්භ කෙරිණි. ඒ අනුව 1978 දි කටුනායක නිදහස් වෙළඳ කලාපය ද, 1986 යේ දී බියගම නිදහස් වෙළඳ කලාපය ද හා 1992 දී කොග්ගල නිදහස් වෙළඳ කලාපය බිහිවිණි.

මෙහි ප්‍රථම වෙළඳ කලාපය කටුනායක ආයෝජන කලාපයයි. එහි සේවයට පැමිණි සේවකයින් ගෙන් 90% ක් ම ස්ත්‍රී කම්කරුවන් ය. ඔවුන්ගෙන් බහුතරයක් කෘෂි ආර්ථික ජීවන තත්වය හිමි ග්‍රාමීය ගොවි පවුල් තුළින් පැමිණි අයයි.

දිනෙන් දින වසරින් වසර කලාපය තුළ ශ්‍රම බලකාය වර්ධනය විය. රැකියා සැපයුම් කළත් ඊට සාපේක්ෂව ලැබිය යුතු මුලික පහසුකම් වන ප්‍රවාහන, නවාතැන් හා සේවකයින්ට ලැබිය යුතු යටිතල පහසුකම් කිසිවක් නොලැබිණි. ශ්‍රමයට සරිලන වැටුපක් නොලැබීම, ශ්‍රම සුරාකෑම්, වැටුප් වල විෂමතා යනාදි ප්‍රශ්ණ මත ඇති වු ගැටලු තත්වයන් තුළ උද්ඝෝෂණ වලට ද පෙරලුනි.

රට තුළ මෙන්ම ආයතන තුළ ද තිබුණු පුරුෂාධිපත්‍යය බල ව්‍යුහය නිසා බහුතරයක් වු ස්ත්‍රී කම්කරුවන් හිතු මනාපේ පාලනය කළ හැකි යැයි ඔවුන් සිතු අතර තම අයිතිවාසිකම් හා නීතිය පිළිබඳව ද එතරම් අවබෝධයක් මේ සේවිකාවන්ට නොතිබුණු නිසා, පාලකයින් ඔවුන් තලා පෙළා වැඩ ගත්හ.

එකලදී ඔවුන්ගේ මාසික වැටුප රු.650/- ක් රු.750/- ක් වු අතර ඔවුන්ගේ සියලු කටයුතු කරගැනීම සිදු වුයේ මේ වැටුපෙනි. එම නිසා අනිවාර්යෙන්ම අතිකාල කිරීමටද සිදු විය. පානීය ජලය, ආහාර නිසි වේලාවට නොලැබීම, ප්‍රමිතියක් නැති නවාතැන් නිසා නොයෙකුත් ලෙඩරෝග වලට ගොදුරුවීම හා වෙළඳ කලාපය තුළට තරුණියන් සංක්‍රමණය වීම ආශ්චර්යක් ලෙස දුටු අවස්ථාවාදීන්ගෙන් වෙළඳ පොලේදි, මඟතොටේදී ත් විවිධ හිංසනයන්ට කම්කරු කාන්තාවන් ගොදුරු විය. මේවාට විසඳුම් ලබා දීමට පාලක පක්ෂයෙන් හා රජ්‍ය මට්ටමින් සෘජු මැදිහත් වීමක් සිදු නොවිණි.

මේ වකවානුව තුළ කටුනායක ශුද්ධ වු කන්‍යාරාමයේ වෙසෙන ගරු විවියන් ප්‍රනාන්දු පැවිදි සොයුරියට කලාපට තුළ සිදුවන විවිධ අසාධාරණකම් පිළිබඳ අවධානය යොමු වී තිබිණි. මේ පිළිබඳ ඇයට සමීපව සිටි කුමුදිනී සොයුරිය සමඟ සාකච්ඡා කර 1984 දී ඩාබිඳු සංවිධානය නමින් පිහිටුවා ගන්නා ලදි. කලාපයේ කම්කරුවන්ගෙන් වැය වන ශ්‍රමය හා හෙලන දාඩිය පාදක කර ගෙන සංවිධානය නම් කළ යුතු යැයි ආරම්භක සමාජිකත්වය අදහස් කළ නිසාම සංවිධානයට ඩාබිඳු යන නම ලැබිණි. එසේම මෙසේ ඇරඹුණු කටයුතු අර්ථවත්ව ඉදිරියට ගෙන යාම සඳහා ක්‍රියාකාරී කමිටුවක් කුඩා ස්ත්‍රී කණ්ඩායමක් පත් විය.

ඩාබිඳු පුරාණය එක් පැත්තකින් මේ අයුරින් විකාශනය වෙද්දී කලාපයේ තුළට ඇදී ආ ශ්‍රම බලකාය වැඩි වෙන්න පටන් ගැණුනි. එම නිසාම නවාතැන් ප්‍රශ්ණ, ප්‍රවාහන පහසුකම්, ඔවුන්ගේ සුරක්ෂිතභාවය, ශ්‍රමය සරිලන වැටුපක් නොගෙවීම හා වැටුප් නොගෙවා අර්ථසාධකය නොගෙවා කම්හල් වසා පැන ගිය පාලකයින් එකල නැතුවා නොවේ.




එම නිසාම ඩාබිඳු පුවත් පතින් පමණක් දැනුවත් කිරීම ප්‍රමාණවත් නොවන නිසා දැනුවත් භාවය වැඩිදියුණු කර ගැනීමට පුස්තකාල පහසුකම් ස්ත්‍රීන්ට අදාල ගැටලු පිළිබඳ ව පත්‍රිකා, වැඩමුළු, ස්වයං රැකියා පුහුණු වීම්. නාට්‍ය, ඉංග්‍රීසි පංති, පරිඝණක පංති, ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ වැඩසටහන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, එච්.අයි.වී ඒඩ්ස් රෝග පිළිබඳව දැනුවත් කිරීම්, කම්කරු නීති, පවුල් සැලසුම් හා ආත්ම ආරක්ෂාව පිළිබඳව අවබෝධය ලබා දුන්නෙමු.

ඩාබිඳු පුවත් තුළින් ද කම්කරු ස්ත්‍රීන්ගේ හැකියාවන් වලට මුලිකත්වය ලබා දුන් අතර කවි, කෙටිකතා, කම්හල් තුළ සිදුවන අසාධාරණකම්, මහ මඟ සිදුවන හිංසනයන්, වසා යන කම්හල් ගැනද, පැවතුණු වැඩ වර්ජන ගැන ද ඩාබිඳුවෙහි වාර්ථා කළේ නොබියවයි. ඩාබිඳු පුවත්පත සිදුවා ලන්නට රාජ්‍ය හස්තයක් ද අප හට දිගු වුවා නොවේ. මෙහි සිදුවන අසාධාරණයන් පිළිබඳ සටහන් තැබීමට අප කිසිසෙත් මැලි නොවිමු.

මෙයට අමතරව කලාපයෙන් පිට සිදුවන අරගල සඳහා අපගේ නොමසුරු සහයද ලබා දුන්නෙමු වෙනත් සංවිධාන සමඟ ගොඩනගා ගත් සහයෝගීතා කමිටු නිදහස් වෙළඳ කලාප ප්‍රදේශයේ වෙනත් කම්කරු සංවිධාන හා ප්‍රජා මුල සංවිධාන සමඟ එකතු වී කම්කරු ස්ත්‍රීන්ගේ අරගල වලට සහය ලබා ගත්තෙමු. කම්කරු අයිතීන්, ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම්, සාමය හා මානව හිමිකම් පිළිබදව අප ද දැනුවත් වෙමින් කලාපය තුළ වෙසෙන කම්කරු ස්ත්‍රීන් ද දැනුවත් කළෙමු. ගොවි, වතු, ධීවර කම්කරුවන්ගේ අරගල වලටද මැදිහත් වුයෙමු.

5 වන පිටුවට...




4 පිටුවෙන්... **නොනිමි මෙහෙවර...**

වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ කුඩා පොත් මුද්‍රණය කර දැනුවත් භාවය ලබා දුන්නෙමු. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව ද ගබ්සා නීති හා නීති ගත නොකලත් ගබ්සා අනියම් ආකාරයෙන් කලාප තුළ සිදු වූ නිසා අනිසි ගැබ් ගැනීම් වලක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳ පවුල් සංවිධානය හරහා දැනුවත් කිරීම් ලබා දුන්නෙමු.

මෙයට අමතරව විදෙස් රටවල වෙසෙන ස්ත්‍රී කම්කරුවන්ගේ ප්‍රශ්ණ අත්දැකීම් බෙදා ගැනීමට හා ඒ කම්කරු කාන්තාවන් හමුවී අරගල වල අත්දැකීම් බෙදාගැනීමට හැකි වූ අතර, ඩාබිඳු විසින් කළ සේවය අගය කරමින් සම්මානයන් ලබා ගැනීමට අවස්ථාව හිමි විය.

ඩාබිඳු දෙස් විදෙස් කම්කරු තොරතුරු වාර්ථා මෙන්ම, කම්කරු ප්‍රජාව සඳහා නීති උපදෙස් තීරයන් ද ඇතුළත් කළේ කම්කරු නීති පිළිබඳ ඔවුන්ට තිබූ අල්ප දැනුම නිසාය. ඩාබිඳු වලට ලිපි බොහෝමයක් ලැබුණේ නිර්ණාමික නිසා සත්‍ය තොරතුරු සෙවීමට අප බෝඩිම් තුළට යාමට සිදු විය. එහිදී අපට වැටහුණේ ආයතන වල සිදුවන අසාධාරණකම් හෙළිදරව් කළහොත් රැකියාව අහිමි වේ යන බියෙන් කම්කරුවන් පෙළෙන බවයි. අප කිසිම දේශපාලන පක්ෂයකට ගැති නොවී ස්වාධීනව ඩාබිඳු කර්තව්‍ය ගෙන ගියත් ඒ වන විට පාලක පක්ෂයේ තර්ජන ගර්ජන වලට ලක් වී තිබුණි.

ඩාබිඳු මෙසේ විකාශනය වෙද්දි, කලාපය තුළ සේවය කරන සේවිකාවන් හට, ලිංගික අතවර, ප්‍රජණ්ඩත්වය, දහදුක් විඳ උපයාගත් පඩි පැකට්ටුව සොරාගෙන යාම වැනි කාරණා දිනෙන් දින ඉහළ යන්නට විය. ස්ත්‍රී දූෂණ වලට ලක් වූ කාන්තාවන්ට ඩාබිඳු මැදිහත් වී නීති අධාර ලබා දුන් අතර අසාධාරණ ලෙස සේවයෙන් පහ කළ සේවක සේවිකාවන්ගේ උද්ඝෝෂණ වලට මූල්‍ය ආධාර ලබා දෙමින් ඔවුන්ව දැනුවත් කළෙමු. ඒ සඳහා ජාත්‍යන්තර සංවිධාන වල සහයෝගය ද ගෙන ඔවුන්ගේ සටන් සාර්ථක ලෙස දිනාගැනීමට හැකි විය. එයට කුපිතවූ සමහර පාලකයින් විටෙක ඩාබිඳු වලට පවසා ප්‍රශ්ණ විසඳා ගන්න කියා තර්ජනය කර තිබිණි.

වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව ජාත්‍යාන්තර කම්කරු සංවිධානයේ නීති රීති රෙගුලාසි තිබුණත් ඒවා නිසියාකාරව ක්‍රියාත්මක කරන්නට ආයතන පාලකයින්වත් රජයේ අදාල වගකිව යුතු නිළධාරීන් වත් මැදිහත් නොවුනු නිසා අසාධාරණකම් හා අවනඩු ඩාබිඳු වලට යොමු වූ අවස්ථා බොහෝය.

1989 භීෂණ සමයයි. එම කාලයේ ඒ වන විට කර්මාන්තශලා තුළ කම්කරු නායකත්වය දරා සිටි කිහිප දෙනෙකු අතුරුදහන් කර තිබුණි. කලාපයේ ෆ්ලොරල් ග්‍රීන්ස් ආයතයේ සේවය කළ රංජිත් සහෝදරයාද අතුරුදහන් වී තිබිණි. ඒ ඔහු සේවය කළ ආයතනයේ තුළ සිදුවන අසාධාරණයන්ට එරෙහිව වූ නිසාය. මෙය ඩාබිඳු සාමූහිකයටද ආරක්ෂක ප්‍රශ්ණ මතු විය ඩාබිඳු ක්‍රියාදාමයන් රාජද්‍රෝහිව කටයුතු කරන බව පවසමින් පොලීසිය අපව ලුහුබදින්න විය. අප මුද්‍රණය කළ සියලු පත්‍රිකාපොත්, පුවත්පත් පොලීසියට රැගෙන ගොස් අපව ද දවස පුරා පොලීසියේ රඳවා ප්‍රශ්ණ කර මුදා හැරියේය. පැවති වාතාවරණය තුළ අපට නිවෙස් තුළ රැඳී සිටීම නොහැකි විය. අප මාසයකයට වඩා නිවෙස් හැර ගිය අතර ඩාබිඳු කාර්යාලය ද වසා දැම්මට සිදු විය. මෙය අපට කවදාවත් අමතක නොවන සිදුවීමකි. නමුත් අප සැලුනේ නැත. නැවත අපි ඩාබිඳු වැඩ ඇරඹුවේ නව පන්නරයකිනි.

ඩාබිඳු සාමූහිකයේ ශාඛාවක් බියගම ද ඒ වන විට ආරම්භ කර තිබුණි. එහි සේවය කරන සේවිකාවන් හට විවිධ ගැටලු නීති ප්‍රශ්ණ ඇති වී තිබුණි. එහි කම්කරුවන් වැඩි ප්‍රමාණයක් සේවය කළ නිසා නිතර වැඩ වර්ජන උද්ඝෝෂණ ඇති විය. ඒ අරගල වලට පූර්ණ සහයෝගය ලබා දුන්නෙමු. වීදි නාට්‍ය ස්වයං රැකියා පුහුණු, පුස්තකාල සේවා, මැහුම් පුහුණු, කුසලතා සංවර්ධන වැඩසටහන් ජාත්‍යන්තර කාන්තා දින, කම්කරු දින සැමරුම් අතර සීඝ්‍රයෙන් බිඳ වැටෙමින් තිබූ කම්කරු අයිතීන් සේවයෙන් ඉවත් කිරීමෙන් හෝ කර්මාන්තශලා වැසී යාමෙන් රැකියා අහිමි වූ විට නව ආදායම් උපයන මාර්ග, බිම්මල් වගාව මැහුම් පුහුණු ලබා දුන්නේ ඒවා කවරදා ක හෝ ඔවුන්ගේ ජීවිත වලට අර්ථවත් වන නිසාය.

බියගම ශාඛාව වසර 10 ක කාලයක් පැවැත්විණි. දිගු කාලීනව පවත්වාගෙන යාමට නොහැකි වුයේ මූල්‍ය ප්‍රතිපාදන නොලැබෙන නිසාය. එහෙත් අපි නොසැලී සිටිය.

යුද්ධය ව්‍යාප්ත වීමත්, ජාතික ප්‍රශ්නය උග්‍ර වීමත් සමඟ තමන්ගේ රටේ විවිධ ජාතීන් ඔවුනොවුන් විශ්වාස නොකරන තත්වයකට පත් වූ බව අප කවුරුත් දන්නා කරුණකි. ඒ පිළිබඳව අපගේ කම්කරු ජනතාවට අවබෝධ කර දීමට අර්ථවත් යැයි අපට වැටහුණි. එම නිසා වතුකරයේ කම්කරු කාන්තාවන් ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන් සමඟ අත්දැකීම් බේදා ගැනීමට සැලැස්විය. එපමණක් නොව උතුරේ යුද්ධයෙන් පසුව එහි ගිය ඩාබිඳු උතුර දකුණ යා කිරීමේ අදහසින් කිලිනොච්චි වව්නියා මඩකලපු යන ප්‍රදේශ තුළ ඇඟළුම් අංශයේ සේවය කරන කම්කරු ස්ත්‍රීන් සමඟ කම්කරු නීති හා වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය, නායකත්ව පුහුණු, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන් හා උතුරේ සිවිල් සංවිධාන හා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් බහුපාර්ශවිය සාකච්ඡා මාලාවන් ද පැවැත්විය..

මෙයින් නොනැවති සිටීමට අපට නොහැකි විය. එයට හේතුවට මෑන් පවර් සේවකයින්ගේ ප්‍රශ්ණ බලවත් ලෙස කලාපය තුළ පැතිරේන්න විය. එයින් ශ්‍රමිකයින් හට කිසිදු වරප්‍රසාදයක් නොලැබෙන අතර කම්කරු නීති වලටද පටහැනිය. එය සමහර විට පාලකයින් හට වාසි වුවත් කම්කරුවන්ට ප්‍රතිලාභයන් නොවන්නේය. එම නිසා ඒ පිළිබඳ කොන්ත්‍රාත් ශ්‍රමිකයෝ යන නමින්ද පොතක් මුද්‍රණය කළේ කම්කරුන් හා ජනතාව දැනුවත් කිරීමටය.

ඩාබිඳු සාමූහිකය වියෙකි යන්නට නොදී ඩාබිඳුව රැකගන්නට අත හිත දුන් සියලු දෙනාටද මූල්‍ය අධාර ලබා දුන් ජාතික හා ජාත්‍යන්තර සංවිධාන වලටද අපගේ ප්‍රණාමය පුද කරමු. එමෙන්ම එදා සිට අද දක්වා ඩාබිඳු වෙත ලිපි, කාව්‍ය, නිසදැස් හා තොරතුරු සැපයූ ඩාබිඳු පාඨකයින්ට අපගේ ස්තූතිය...

**එච්. අයි. සමන්මලී**

# ඩාබිඳු 35 වන සංවත්සර සුබපැතුම්

## ඩාබිඳු ඔබට සුභ පැතුම්

අවුරුදු 35 ක් ඔබ ආ ගමන් මග අති දුෂ්කර බව අපි හොඳාකාරවම දන්නවා... එත් ඔබ නොසැලී පෙරට ආවෙමු... ඒ ඔබගේ ශක්තිය හඳුනාගත් නිසාය... එමෙන්ම විශේෂයෙන් කම්කරු කාන්තාවන්ගේ දුක, වේදනාව හදුනාගත් නිසාය... කම්කරුවන්ට සිදුවන්නා වු අසාධාරණයන් හමුවේ සැම විටම ඔබ නොබියව සහ ශක්තිමත් ලෙසින් ඔබගේ පන්හිඳ හසුරුවන්නට ඔබ ගත්තා වු උත්සාහය අතිමහත්ය... එසේම නොයෙකුත් බාධක හමුවේ පුරා වසර 35 ක් ඔබ ගත්තා වු උත්සාහයට අපගේ ප්‍රණාමය පුද කරන අතර තවත් මෙවන් ගමනක් යාමට ඔබට ශක්තිය නොවඩුව ලැබේවායි ප්‍රාර්ථනා කරමි...

**සුගත් රාජපක්ෂ**
**වාණිජ හා කාර්මික සේවක සංගමය.**

## 35 වැනි සැමරුම

ඔබ සරන මාවතෙහි
කටු අකුල් රළු බොරළු
බාධා කොහිද සබඳ
එමග සැරිසරන නුඹ
හෙළන්නේ නම් යමක්
අන් කිසිත් නොව සබඳ
අමිල නුඹ ඩා බිඳුය...
මෙතිස් පස් ගෙවූ වසර
කුසුමක්ව පිපීමෙන්
අප උනුන් සිප වැළඳ
බෙදාගමු ඒ සුවඳ
කිසිත් කිසි තැනක හෝ
කිසිම විටකදිවත්
හෙළු දහඩිය බිඳෙක්
අපතේ යාමක් නොමැත
ඒ සියල් ගලා යයි
දිනුම් කණුව ජලාශෙට...
සරන කල නොනැවතී
නැතක් දිගු මාවතේ
නුඹ වෙතින් අප සියල්
ලද දැනුම් බෝ වෙතේ..
නගා ජයකොඩිය අප
තබා පියවර පෙරට
දිනා ගන්නට ලොවම
දුන් දිරිය අපමණය

හෙළා ඩාබිඳු නොමඳ
නගා හසරැලි ඉතින
නුඹේ එළියෙන් ලොවට
මවයි නායක පිරිස
නළලතෙහි ගලා එන
දහදියෙන් සැල කෙරූ
දිගු ගමන කෙළවරේ
ඇතේ ජය කෙළි දිනු
ඔබේ දහදිය බිඳෙන්
ලොව පියවරක් ගොසින
හෙටක් අප හා සමඟ
රුදෙනු දිරියෙන් පෙරට
ර්දින් නුඹ උපන් දින
නිතින් මා පතන්නෙමි
අදින් පසු හෙට දිනට....

**අයින්කරන් ශ්‍රීකාන්ති**
**ඩාබිඳු සාමූහිකය**
**කිලිනොච්චි දිස්ත්‍රික්ක**
**සම්බන්ධීකාරිනි.**

## සුබ පැතුම්

ශ්‍රී ලංකාවේ ඇඟළුම් කම්හල් සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් දිවා රෑ නොබලා තිස්පස් වසරක් කැපවී අරගල කළ ඩාබිඳු සාමූහිකය වෙත අපගේ උණුසුම් සුබපැතුම් මෙසේ එක්කරමු. ශ්‍රී ලංකාවේ මානව අයිතීන් ක්ෂේත්‍රයේ පවතින ගැටලු අතර ප්‍රධාන වශයෙන් ඇඟළුම් ශ්‍රමිකයන් මුහුණ දෙන වැටුප්, සෞඛ්‍ය, පෝෂණය, අතිකාල දීමනා, නිවාඩු මෙන්ම වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට ඇති අයිතීන් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමටත් බොහෝ අයිතීන් දිනා දීමටත් ඩාබිඳු සාමූහිකය පෙරමුණ ගෙන කටයුතු කරයි, සටන් කරයි, එම සටනේ කම්කරුඅයිතීන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන අතළොස්සක් අතර ඩාබිඳු සාමූහිකය හෙලූ ඩහදිය අප්‍රමාණ ය. ස්වර්ණමය..තිස්පස් වසර පසුකිරීම යනු කඩඉම් ගණනාවක්, අභියෝග රැසක් පසු කර ආ වැදගත් සන්ධිස්ථානයකි. ඒ සඳහා ඔවුන් මෙතෙක් ලද පන්නරය සහ යෙදවූ සහෘද බලය නොකැඩී, නොසැලී එක්සිත්ව පෙරමුණ ගෙන තවදුරටත් කටයුතු කරගෙන යාමට අවශ්‍ය ආත්මවිශ්වායෙන් යුතු ශක්තිමක් ගමනක් සඳහා සුභපැතුම් ඉතසිතින් එක්කරමු.

**වේලායුදන් ජයචිත්‍රා - ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරී**
**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**

## 35 වැනි වසරෙහි පා තබන ඩාබිඳු සාමූහිකයට සුබ පැතුම්

පසුගිය අවුරුදු හතර පුරාම උතුරු පළාතේ වවුනියා, මන්නාරම, මඩුක්කුලම් සහ ඕමන්ත යන ප්‍රදේශයන්හි ඩාබිඳු "වවුනියා සංගමයක්" වශයෙන් සහභාගීත්වය ලබා දීම, සතුටුදායක කරුණකි. ඩාබිඳු, අවුරුදු 35ක කාලයක් ගත වී තිබියදීත් විශේෂයෙන් කාන්තා කම්කරුවන් දැනුවත් කිරීමට ගත් උත්සාහයන් සහ කම්කරු අයිතිවාසිකම්, සෞඛ්‍ය සහ පෝෂණය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ මාතෘ සෞඛ්‍යට අදාළ වෛද්‍ය කඳවුරු පවත්වමින් අප හා එකතු වී පැහැදිලි කිරීම සඳහා ක්‍රියා කරමින් සිටීම ද අපට අනුබලය ලබා දෙයි. එම නිසා මේ මොහොතේ ඩාබිඳු හඳවතින්ම සිහිපත් කරමි. එමෙන්ම අපගේ ගැටළු, ජාත්‍යන්තරය දක්වා ගෙන ගිය ඩාබිඳු, දශක ගණනාවක් යහපැවත් වේවායි යනුවෙන් ප්‍රාර්ථනා කරමු...

**පත්මනාදන්**
**ඩාබිඳු වවුනියා සම්බන්ධීකාරක**

## සුභාශිංසන

කම්කරු පංතියේ අයිතීන් තහවුරු කිරීම උදේසා උරේන් උර ගැටී.. කළා වු උදාර මෙහෙයට වසර 35 ක දිගු ගමනක් පැමිණි ඩාබිඳු සාමුහිකයට හඹළුවී හී උණුසුම් සුභ පැතුම්....

**NUMMS**

## ඩාබිඳු 35 වන සංවත්සරයට ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරයේ සහෝදරාත්මක සුභ පැතුම්

ජාතියට ලබාදෙන තමන්ගේ කොටස ඉහලින්ම ලැබ දෙමින් කුසට නිසි පෝෂණය ගතට සුව නොලබමින් රැවටිලි ද, ඇවටිලිද බලහත්කාරයට යට වෙමින් කම්හලේ ෆැක්ටරියෙ ජීවිතය දිය කරන නිදහසක් අයිතියක් හොඳ නමක් ජීවිතයෙන්ම අහිමිවූ වෘත්තීය අයිතියක් ව්‍යුහයෙන්ම සීමාකල වහල් මෙහෙවරට වෙහෙසවී දූක් විඳන් අපහාස උපහාස මැදින් හිස තබා නිදන්නට ආරක්ෂිත නිවහනක් අහිමිවූ ජීවිතය බිඳ වැටුනු සොයුරු සොයුරියන් මව් පියන් පෝෂණය කරන්නට වෙර දරන කලාපයේ සොයුරියන්ගේ ඩහදියට කඳුලට මෙන්ම තාපගිනි නිවන්නට වටිනාකමක්, ගෞරවයක්, වෙනසක් තුලින් අර්ථයක් දෙන්නට වෙහෙස නොබලා අරගල කරන සදාදරණීය ඩාබිඳු සොයුරියනේ වහල් නීතින් මැදින් මර්ධනයට මුහුණ දෙමින් සමාජය තුල කම්කරු ශ්‍රමයට උරුම පීඩනයට ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී කලාපයේ සොයුරියන්ගේ විමුක්තියත් පීඩිතයන්ට ශක්තියත් උදෙසා දශක තුනහමාරක් ඔබ දියත් කල අරගලයට තවත් එවැනිම පීඩිතවූත් කොන්කලාවූත් ශ්‍රමයට සාධාරණයක් කිසිකලෙකත් නොලැබුනාවූත් මර්දනයට ලක්වෙමින් ජීවිතයෙන් වන්දි ගෙවමින් ජීවිතය ගැට ගසන ජන පිරිසක්වූ ධීවර ජනයා නියෝජනය කරන ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරයේ සහෝදරාත්මකවූත් ගෞරවනීය වූත් ආචාරය මෙසේ පුද කරමු

**හර්මන් කුමාර - ජාතික කැඳවුම්කරු**
**ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය**

## දායාබර ඩාබිඳු...

වසර 35 ක් පුරා අප සමඟින්
නිබඳව අත්වැල් බැඳ සිටි ඔබ
අපට ලබා දුන් මෙහෙවර අගනේය...
අච්ච වැස්ස රැය දවාලක් බැලුවේ නැත...
කලාපයේ කම්කරුවන් වන අප සමඟ
සැම මොහොතකම ඔබ සිටි බව සැබෑය...
සෞඛ්‍ය පෝශණය දැනුවත් කිරීම්
විවිධ වු අධ්‍යාපන පාඨමාලාවන්
මඟ පෙන්වා දුන්නේ ඔබමය...
ඩාබිඳු කුමරියේ 35 වසරක
අභිමන් සමරන අද වැනි යුගයක...
අගයෙමි නුඹ ගැන
ඔබ අපට කරනා මෙහෙය...
කියා නිම කළ නොහැක මෙලෙසින්...
තවත් චිරාත් කාලයක්
අලුත් අත්දැකීම් හා තව බොහෝ දේ රැගෙන
අප සමඟ නිබදව අත්වැල් බැඳගන්නට හැකි වේවායි
පත්න්නෙමි...
ඔබ හට දිගාසිරි සදාකල් වැජබෙන්නට...



**ඒන්. ප්‍රියදර්ශණී**

# සිතුවිල්ල

ඔක්කොම කුණු බේරේ බොක්කට කීවාලු කියා සෝමා බෝඩිම තුළට රිංගුවේ ආඩපාලිද ඇදබාගෙනය... මොකක්ද බං අද වුණු ජංජාලය... කුණු ලොරියක් වත් ඇවිත් බෝඩිම ලඟ බාලා ගියා වත්ද?...

නැහැ අනේ කලාපේ තියන කුණු ගොඩවල් දමා ගන්න බැරිව නගරසාභාව තැවෙනවා... ඒ අය කියන්නේ මෙහෙ ජීවත් වන පවුල් වඩා රැකියාවට එන අයගේ කුණු අදින්න ලැබිලා තියෙන නගරසභාවේ වාහන ප්‍රමාණවත් මදි කියලා. ඒ මදිවට අපටත් රක්ෂාවක් කරගෙන ජීවත් වෙන්න බැරි පරිසරයක් දැන් තියෙන්නේ... අපිරිසිදු ජලය... පානීය ජල ප්‍රශ්න... ගණනාවක අප ජීවත් වන්නේ කාණු පිරිලා... මදුරුවෝ මැස්සෝ... අලි මදිවවට හරක් කීවාලු... කියා සෝමා ඇඳට පැන්නේ ජොන්නා වගෙයි හරියට... හෙමින් ඉදගනින් ඔය අටමඟල කැඩිලා තියෙන්නේ කෝකටත් තෛලය කියලා ඉඳගන්න... නිදියන්න... රෙදිටික දා ගන්න... ඔය සංගිලි පාලම වගේ හෙලවෙන ඇද කඩලා දලා අපට කියලා සැප නින්දක් තියෙනවාද... ඇද බදන් නිදිය නොගත්තොත් මදුරුවෝ උඩින් ඇවිත් උස්සන් යයි කියලා... සෝමා හදාගෙන ආපු ත්‍රිපෝෂ ගුලි ටික දික් කළේය... ඉන්න මම කිරි විදුරු දෙකක් හදාගෙන එන්නම්... කාලා බොන්න අප්පාට බොල උඹට ගිය කල... කහට බී බී හිටිය කෙනා දැන් කිරි ගහන්න පටන් අරන් අනේ අපේ ශරීර කුඩුවත් ආරක්ෂා කර ගන්න එපැයි... අනාගතේ අම්මලා වෙන්න ඉන්න අපිනේ නැත්තම් අපි මන්දපෝෂණයෙන් පෙලෙන එවුන් කියලා බඳින එකකුත් නෑ...

බලන්න යසෝ මේ කලාපේම කර්මාන්තශාලා කොච්චර තියෙනවාද... බෝඩිම්, වෙළඳසැල් තියෙනවා ද, මේ ගමේ ජීවත් වෙන පවුල්... මේවායින් පිටවන අපද්‍රව්‍ය කොච්චරද... ඔයා දැක්කාද රූපවාහිනියේ පෙන්නපු කුණු ලොරි ගණන් වලින් ගෙනත් දාලා තිබුණු කුණු කන්දරාව... පණුවෝ ගහලාද මන්දා රෝහල් වලින් පිටකරන අපද්‍රව්‍යත් තිබුනාලු... අනේ මේ ඔය කුණු ගොඩවල් අවුස්සන්නේ නැතිව වෙන මොනවත් නැද්ද...

ඕවා ඉතින් මහා උන්ගේ වැඩනේ ඕන කුණු කන්දරාවක් බාරගන්න රුසියෝ අපේ රටේ ජීවත් වන මිනිසුන්ට හෙන ගහලා ගියත් කමක් නැහැ රට විකුණන් කාලාමයි පුරුදු එතකොට එයාලාට මල්ල කරේනේ... අපිට කීයක් හරි පඩි වැඩි කරලා දෙන්න තමයි ඇඹරෙන්නේ... ඇති ඇති මක් කරන්න ද කුම්බලා මාළු කැවානම් විදවපන් බලලෝ කීවාලු මෙහෙන් පිටවෙලා යනකම් මතකනේ අතීතය...

**සමන්තා**

# ඩාබිඳු 35 වන සංවත්සර සුබපැතුම්


## චිරං ජයතු ඩාබිඳු

හමන සුළගත් සුනාමියසේ
හමා දස අත උගුලුවා මුල්
හලා අතුඅග පිපුණු කුසුමක්
තලා පොඩි කර දෙපා පා මුල

සිනා ලාබ හඬ නගා දොර දොර
වසා කන්බෙර නඟා සොරහඬ
යෝධ බැලූ මන්නේක පැහැයෙන්
යවා ගුවනත පුවත් නුලෙන්

දමා නැණ මල් පටන් පෙර කිස
ගරා රන්මසු 'පික් පොකට්' ලෙස
පුරා රටට මරවටවා දන නෙත
අරා ඇස මට වැටි ගිණිකන

සලා ඩාබිඳු මල්දමක් සේ
වටා ගොනුවු නදිරි ලඳුන්ගේ
මරා දුර්මත අරක්ගත් හිස
නඟා කල දිය සිය පතක් විය
ගෙවා ආ මඟ ඩාබිදක් වග



**චිරං ජයතු ඔබට ඩාබිඳු...**
**සිරි ෆොන්සේකා**
**පෙතියාගොඩ**

## ඩාබිඳු

ඩාබිඳු... ඔබ කාන්තා දැස් විවෘත කළා. දැනුම වර්ධනය වෙමින් දියුණු විය. ඔබ කාන්තා සබ කෝලය දුරස් කරමින් වීරත්වය වර්ධනය කළා. මා ඔබ සමඟ බැඳී වසර තුනක් ගත වී ඇත. දැනුම බොහොමයන් ලබා ගත්තෙමි. මා ලබාගත් දැනුම අන් අයට ලබාදීමට බොහෝ අවස්ථා උදා කර දුන්නා. ඔබේ සේවය දියුණු වීම සඳහා සුබ පතන වවුනියා සම්බන්ධීකාරිකා

ජෙය ප්‍රසාන්තන් සිවරූබි

## ඩාබිඳු

පුංචි තරු කැට මෙන්
ඩාබිඳුලොවම සිසාරා
හෙට ලොව බබළවන්නට
පිය නගන්නේ... ඩාබිඳු
දැත් පොඩි පා තබමින් ඩාබිඳු
හෙට ලොවම ජය ගන්න
අසරණ ජීවිත වලට පණ පොවමි...
අළුත් අළුත් දේ සොයාගන්නට
වෙර දරණ පුංචි මිනිසුන් වෙනුවෙන්
ඩාබිඳු සුවඳ හමයි දස අතම
ඩාබිඳු තිස්පස් වසරක
අභිමානය සමරන
අනාගතය ඔබයි හෙට දවස ඩාබිඳු

**සුහ අනාගතයක් ඩාබිඳු පත්තරේට...**
**සජිත් නිශ්සංක - දකුණු කොරියාව**

## සුබ පතමි...

කාරුණික නෙත් සියල් පියකරු ය...
නැවුම් නිමැවුම් මවන සිත් මඩල පිවිතුරුය...
මිහිරි තෙපුලෙන් මැවෙන් දෙතොල්පෙති සුන්දරය
නිල් අඹර සරසනා සොමි වුවන සුන්දරය...
ලෝ සතට සෙත සදන ඩාබිඳු ද සුන්දරය...
සොදුරු ලිය හිමන් ලබන
ඩාබිඳුගේ පවසනා සරසනා
කවි වදන් සුන්දරය...
සෙනෙහෙ හදකින් පතමි...
ඩාබිඳු ට අචාර...
යෙහෙන් වැජඹී ඉන්න...



මීරා
වවුනියා

## මගේ ලොවට ඔබ

මෙතෙක් කල් මා ආ දිවි ගමනේ...
ඔබයි මට ශක්තිය වුණේ...
ඒ නිසයි මා ආදරේ හදවතින් ඔබව වැළඳ ගන්නේ...
මේ කුරිරු සමාජයේ අසාධාරණයට එරෙහිව
දෙපයින් නැගිට සිටීමට මට දිරිගන්වා...

මට ඔවදන් දී මාව දිරිගන්වා මගේ අරමුණු
සාර්ථකව කර ගැනීමට පිහිට වූ...
ඩාබිඳු මාතාවනි ඔබට චිරාත් කාලයක්
වැජඹේවා කියා...
මා හදවතින් ප්‍රර්ථාන කරමි...

**රෝෂිණී විරසිංහ**

## නැගෙන් ඩාබිඳු

චණ්ඩ මාරුත කොතෙක් ආවත්,
හැපුනේ නෑ කිසිදා එහි
රළු කලාපේ යෝධයෙකු ලෙස
බැබලුනා පස් තිස් වසක්
සිතට දිරියකි.
නැගෙන් ඩාබිඳු
තවත් බෝ කල්
තැලෙන දනහට දිරි දීදී...

**චිරං ජයතු ඩාබිඳු**
**RED ආයතනය**

# වසරක පිය සටහන්...



















අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.